# මහජනතාව, දේශපාලන පක්ෂ, සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් වෙතින් ලිඛිත අදහස් කැඳවීම

අතිගරු ජනාධිපතිතුමන් විසින් අංක 2354/06 දරන 2023. 10. 16 දිනැති සහ අංක 2356/29 දරන 2023. 11. 02 දිනැති අති විශෙෂ ගැසට් පත්‍ර මගින් පත් කරන ලද 'මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව', යහපාලන මූලධර්මවලට අනුගත වෙමින් සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් කාලීන සමාජ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දැනට පවත්නා මැතිවරණ නීති සංශෝධනය වීමෙ අවශ්‍යතාවය සලකා තොරතුරු ලබා ගැනීම, විමර්ශනය සහ පරීක්ෂා කිරීම උදෙසා ලිඛිත අදහස්/යෝජනා අපේක්ෂා කර සිටියි.

මෙහිදී :

කාන්තා හා තරුණ නියෝජනය වැඩිකිරීම; මැතිවරණය ප්‍රකාශයට පත්කළ දින ප්‍රතිඵල නිකුත් කරනු ලබන දින දක්වා වන කාලය අඩුකිරීම; ඉලෙක්ට්‍රොනිකව ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව සැලසීම; විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ද ඡන්දය භාවිතා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය; එකම පුද්ගලයෙකුට පළාත්සභා සහ පාර්ලිමේන්තු යන මැතිවරණ දෙකට ම තරඟ කොට තේරී පත්වුවහොත් අදාල ආයතන දෙකම එකවර නියෝජනය කිරීමට අවස්ථාව ලබාදීම; මැතිවරණ දිනයේ දී සේවාවන් සපයන රාජ්‍ය සංස්ථා/රාජ්‍ය ව්‍යාපාර සහ පෞද්ගලික අංශයේ සේවකයින්ට ද තැපැල් ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාව ලබාදීම; සමානුපාතික නියෝජන ක්‍රමයට පමණක් සීමා නොවී, මහජන නියෝජිතයින් තෝරා පත්කරගැනීම සඳහා සමාජයේ බහුත්වවාදී ස්වභාවය පිළිබිඹු වන කේවල ක්‍රමය ද සමඟ සම්මිශ්‍රණය වූ ක්‍රමවේදයක් සකස් කිරීම; බහු පක්ෂ ක්‍රමය ශක්තිමත් කිරීම; දේශපාලන පක්ෂ තුළ මුදලෙහි භූමිකාව සහ ප්‍රතිපත්ති ග්‍රහනයට ඇති අවස්ථාවන් වැලැක්වීම; දේශපාලන පක්ෂ සාමාජිකයින් වෙත නායකත්වයේ වගවීම; ජාතික සමගිය ශක්තිමත් කිරීම සඳහා දේශපාලන පක්ෂවල කාර්ය භාරය;

මෙන්ම :

දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විසින් මාධ්‍ය භාවිතා කලයුතු ආකාරය; ඔවුන් විසින් පොදු කටයුතු ඉටුකිරීමේදී හැසිරිය යුතු ආකාරය; දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සහ විශ්වාසනීයව හා මහජනතාවට වගකියන අයුරින් ඒවායෙහි කටයුතු කිරීම සඳහා ක්‍රමවේදයන්, නීති රීති සහ උපමානයන් සකස්කිරීම උදෙසා **මහජනතාව, දේශපාලන පක්ෂ, සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් වෙතින් ලිඛිත අදහස්/යෝජනා අපේක්ෂා කර සිටියි.**

- ඔබගේ ප්‍රතිචාරයන්, **2023. 12. 15** දින හෝ ඊට පෙර ලැබෙන ලෙස sec.coi@presidentsoffice.lk යන විද්‍යුත් ලිපිනයට හෝ ලියුම් කවරයෙහි ඉහළ වම්පස කෙළවරෙහි **"මැතිවරණ සංශෝධන"** යනුවෙන් සඳහන් කර, මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්ගේ පහත සඳහන් ලිපිනයට තැපැල් කර හෝ එවිය හැකිය.

- ප්‍රතිචාරයන්, පරිගණකයෙන් යතුරුලියනය කරන ලද මෘදු පිටපත් ලෙස ලැබීම, ඒවා ඒකරාශී කිරීම සඳහා පහසුවක් වන බැවින් අදාළ අදහස්/යෝජනා, විද්‍යුත් තැපැල් පණිවුඩයට ඇමුණුමක් (Attachment) ආකාරයෙන් මෘදු පිටපතක් ලෙස එවීම ඉතා අගයකොට සලකමි.

ඔබගේ ප්‍රතිචාරයන්හි සඳහන් වී ඇති ඇමතුම් තොරතුරු සහ ඇතුළත් වී තිබිය හැකි පෞද්ගලික දත්ත කිසිවක් වෙතොත් ඒවා රහස්‍ය ලෙස සලකා ක්‍රියාකරනු ලැබේ.

**ලේකම්**
මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ
ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

ලිපිනය : අංක 21, SEMA ගොඩනැගිල්ල
ජනාධිපති මාවත,
කොළඹ 01.

15. 11. 2023